**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය - 2024**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 8 හි 22 ඡේදය අනුව නැවත අයකර ගැනීමේ අඩු භව්‍යතාවයක් පවතින වත්කම් සම්බන්ධයෙන් හානිකරන පරීක්ෂාවන් සිදු කල යුතුව තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂයන් යටතේ ගිණුම්ගත කර තිබූ එකතුව රු.760,275ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ආපනශාලා කුලියෙන් රු.100,000ක් අයකරගත් බවත්, අර්ථසාධක අරමුදල් සහ ගොවීන්ගේ භාරකාර අරමුදලින් ලැබිය යුතු ශේෂයන් සඳහා නීතිමය ක්‍රියාමාර්ග සහ හානිකරන පරීක්ෂාවන් සිදුකරන බව. | හානිකරන පරීක්ෂාවන් සිදුකර ඒ අනුව මූල්‍ය ප්‍රකාශන තුළ අවශ්‍ය ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ආයතනය විසින් අවු 30.කට ආසන්න කාලයක් ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් හරහා බදු පදනමින් ලබාගෙන ඇති ආයතනය පිහිටි ඉඩම සංවර්ධනය වෙනුවෙන් දරා තිබූ රු19,903,165.ක මුදල වියදමක් ලෙස හඳුනා නොගෙන වත්කම් ලෙස ප්‍රාග්ධනිත කර තිබීම නිසා ඉඩම් වටිනාකම හා සමුච්චිත අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2025 වසරේදී නව බදු ගිවිසුම සමඟ අවශ්‍ය වෙනස්කම් සිදු කරන බව. | අයභාර වියදම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7හි 50 ඡේදය අනුව වෙනම වත්කම් පන්ති ලෙස හඳුනාගත යුතු ජලනල පද්ධති සහ මත්ස්‍ය කොටු ඉදිකිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී වැයකළ එකතුව රු.12,937,701ක් ගොඩනැගිලි යටතේ වර්ගීකරණය කර තිබුණි. | 2025 වර්ෂයේදී එය නිවැරදි වර්ගීකරණය යටතේ ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | ප්‍රාග්ධන වියදම් නිවැරදිව වර්ගීකරණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අනෙකුත් ජංගම වගකීම් යටතේ දක්වා ඇති ඉකුත් වර්ෂයන්හිදී හා සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ රු1,046,534.ක හඳුනානොගත් ආදායම් නිවැරදිව හඳුනාගෙන අදාල වර්ෂයන්හි ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. | හඳුනාගත නොහැකි තැන්පතු ලෙස බැංකු සැසඳුමෙහි ඉදිරිපත් කරන බව සහ 2025 වසරේදී රු.483,078ක් නිරවුල් වී ඇති බව. | ඒ ඒ වර්ෂයට අදාළ ආදායම් නිවැරදි ආදායම් කාණ්ඩය යටතේ හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ඉකුත් වර්ෂයන්හි ඉඩම් බදු ලෙස වැඩිපුර ගෙවා තිබූ රු525,501.ක මුදල කලින් ගෙවූ ශේෂයක් ලෙස ගිණුම්ගත කිරීමකින් තොරව අදාළ වර්ෂයේ වියදමට කපා හැර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | අදාළ වටිනාකම් කලින් ගෙවූ ශේෂ ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළදී සම්පූර්ණයෙන් ක්ෂයවී තිබූ පිරිවැය රු311,816.ක් වූ විදුලි උපකරණවල වටිනාකම හා ඊට අදාල ක්ෂය වෙන් කිරීම මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද දේපළ, පිරියත හා උපකරණ උපලේඛනයෙන් අත්හැරී තිබුණි. | නිරීක්ෂණය සමග එකඟ වන බව. | වත්කම් භාවිතයෙන් ඉවත් කරන තෙක් සියලු දේපල පිරියත හා උපකරණ වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගත යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි මෙහෙයුම් ක්‍රියාකාරකම්වල කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ සහ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබූ අයිතමයන් 05 කට අදාළ අගයන් පිළිවෙලින් රු.961,814ක් වැඩියෙන් හා රු.1,048,328ක් අඩුවෙන් දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව ඉදිරිපත් කර ඇති බව. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය නිසි සැලකිල්ලෙන් පිළියෙල කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනය සතු ආපන ශාලාව බාහිර පාර්ශවයන් හා ගිවිසුම්ගත වී කුලියට දීම වෙනුවෙන් එකී ගිවිසුමේ සඳහන් 1.6 හා 12.4 වගන්ති ප්‍රකාරව ආයතනය ක්‍රියා නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ඉකුත් වර්ෂයන්ට හා සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු ශේෂය රු.186,400ක්ව පැවතුණි. | හිඟ හිටි වටිනාකමින් රු.100,000ක් 2025 වර්ෂය තුළදී අයකර ගත් බවත් ඉතිරිය සඳහා හානිකරන පරීක්ෂාවක් සිදු කරන බව. | අදාළ කුලී මුදල් අයකර නොගැනීම සම්බන්ධව වගකීම් සහිත නිලධාරීන් පිළිබඳ කටයුතු කල යුතු අතර අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2014 හා 2015 වර්ෂවලදී ගොවීන්ගේ භාරකාර අරමුදල මගින් ශිෂ්‍යයින්ට ලබා දී තිබුණු ණය මුදල් වලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.533,890ක ණය අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | 2025 වර්ෂයේදී මෙම ණය මුදල කපා හැරීම සම්බන්ධයෙන් තීරණයක් ගනු ලබන බව. | අදාළ ණය අයකර ගැනීමට හෝ විධිමත් අනුමැතියක් සහිතව කපා හැරීමට හෝ කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ xx වැනි පරිච්ඡේදයේ අංක 3.1 අනුව | ආයතනයේ සේවයේ නියුතු අධ්‍යයන කාර්යය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීම සඳහා විධිමත් පරිදි ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණි. | පැමිණීමේ ලේඛන පවත්වා ගෙන යන බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූල වන පරිදි කටයුතු කළ යුතු අතර එයින් බැහැරවීම් සම්බන්ධව විනයානුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වන වගන්තිය | 2023 වර්ෂය සඳහා ආයතනය වෙත ඉදිරිපත් කළ 2024 අප්‍රේල් 29 දිනැති විස්තරාත්මක කළමනාකරණ විගණකාධිපති වාර්තාව සඳහා මාස 03ක් ඇතුළත ගනු ලබන ක්‍රියාමාර්ග ඉදිරිපත් කළ යුතු වුවත් මෙම වාර්තාවේ දින වන විටත් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ත්‍රෛයි වාර්ෂික වාර්තා ඉදිරිපත් කර ඇති අතර එමගින් තොරතුරු මහ හැරී ඇත්නම් අවශ්‍ය තොරතුරු සපයා දීමට එකඟ වන බව. | 2023 වර්ෂයේ කළමනාකරණ විගණන වාර්තාව සඳහා ඉතා කඩිනමින් පිළිතුරු ලබා දිය යුතුය. |
| (ඇ) | 1995 ජූලි 14 දිනැති අංක 636 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන වලට අනුගත නොවී 2023 හා 2024 වර්ෂවල පවත්වන ලද විභාග 16ක ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා දින 23 සිට දින 347 දක්වා කාලයක් ප්‍රමාදවී තිබූ අතර ප්‍රතිඵල නිකුත් නොකළ විභාග 16ක විගණිත දිනය වූ 2025 අප්‍රේල් 29 දින වන විට ප්‍රමාද කාලය දින 8 සිට 330ක් දක්වා වූ පරිසයක් ගෙන තිබුණි. | කාර්ය මණ්ඩලය සීමිත වන බැවින් යම් යම් ප්‍රමාදයන් සිදු වුවද ඉදිරියේදී අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන බව. | විභාග ප්‍රතිඵල චක්‍රලේඛයේ සඳහන් නියමිත කාලය ඇතුළත නිකුත් කිරීමට කඩිනමින් පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය හා 2023 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 8.2.2 ඡේදය | ආයතනයේ අතිරික්ත මුදල් ආයෝජනය කිරීම සඳහා අදාළ අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව ස්ථාවර තැන්පත් 45ක රු.68,986,340ක් රාජ්‍ය බැංකුවක ආයෝජනය කර තිබුණි. | ආයතනයේ ආයෝජන සහ කළමනාකරණ කමිටුවේ අනුමැතිය සහිතව කෙටි කාලීන ආයෝජන සිදුකළ බව. | අදාළ අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව ආයතනයේ අතිරික්ත මුදල් අයෝජනය කළ යුතුය. |
| (ඉ) | ආයතනයට අදාළ 2008 අංක 2 දරන නියමාවලියේ 4(එ) වගන්තිය | ආයතනයේ කාර්යය සඳහා අවශ්‍ය පුස්තකාල පහසුකම් පවත්වාගෙන ගොස් නොතිබීම හේතුවෙන් පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු පොත් 1150ක් සහ ආයතනය විසින් මිලදී ගෙන තිබූ රු.643,498ක් වටිනා පොත් 162ක් වසර 8ක සිට ශිෂ්‍යයින්ට පරිහරණය කිරීමට ප්‍රමාණවත් පහසුකම් සලසා නොතිබුණි. | තාවකාලික පදනම මත පුස්තකාල සහායකයෙකු බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | ශිෂ්‍යයන්ට පොත්පත් පරිහරණය සඳහා ප්‍රමාණවත් පහසුකම් කඩිනමින් සකස් කළ යුතුය. |
| (ඊ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 123(8) වගන්තිය හා 2024 මාර්තු 21 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කර තිබූ අංක 2376/25 දරන ගැසට් නිවේදනයෙහි උපලේඛන 1 හි 4ඡේදය | සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 101කදී සැපයුම්කරුවන් වෙත ගෙවන ලද රු.2,654,959ක VAT බදු පිළිබඳ තොරතුරු මාසිකව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | යවන ලද විද්‍යුත් පණිවිඩ ලබාදීමට කටයුතු කරන බව | පනත ප්‍රකාරව VAT පිළිබඳ තොරතුරු මාසිකව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.21,916,685 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,727,989 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.24,644,673 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට උපාධි පාඨමාලා ආදායම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

2.2.1 ඉකුත් වර්ෂයට සාපේක්ෂව වෙනත් ආදායම් රු.90,329,194ක සිට රු.113,981,587ක් දක්වා සියයට 26 කින් ද, පොලී ආදායම් රු.2,650,050ක සිට රු.4,186,897ක් දක්වා සියයට 58 කින් ද රජයේ පුනරාවර්තන ප්‍රදාන රු.69,000,000ක සිට රු.96,978,500ක් දක්වා සියයට 41 කින් ද වෙනත් පුනරාවර්තන වියදම් රු.18,019,839ක සිට රු.19,310,617ක් දක්වා සියයට 07 කින් ද වැඩි වී තිබුණි.

**2.3 අනුපාත විශ්ලේෂණය**

ඉකුත් වර්ෂයට සාපේක්ෂව ජංගම අනුපාතය 3.4 සිට 7 දක්වා ද ක්ෂණික අනුපාතය 2.6 සිට 6 දක්වාද වැඩි වී තිබුණු බැවින් ඉකුත් වර්ෂයට සාපේක්ෂව ආයතනයේ කාරක ප්‍රාග්ධනය වඩාත් හිතකරව පැවතුණි.

**3 මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් හා සමාලෝචිත වර්ෂයේදී පවත්වා තිබුණු විභාග 17ක් සඳහා ශිෂ්‍යයින් 2136 දෙනෙකු පෙනීසිට තිබුණු අතර ඉන් ශිෂ්‍යයින් 924 දෙනෙකු විභාග අසමත්වී තිබුණි. ඒ අනුව විභාගය අසමත්වීමේ ප්‍රතිශතය සියයට 09 සිට සියයට 67 දක්වා පරාසයක පැවතුණි. | මෙම පාඨමාලාවට බඳවා ගන්නා සිසුන්ගේ Z අගය අඩු නිසා අසමත් ප්‍රතිශතය මුල් වර්ෂවල වැඩි වියහැකි අතර පසුව ක්‍රමයෙන් අඩුවන බව. | මෙය ආයතනයේ මූලික අරමුණ හා බැඳී පවතින නිසා ශිෂ්‍යයින්ගේ සමත්වීමේ ප්‍රතිශතයන් ඉහළ නංවා ගැනීමට ඉගැන්වීමේ හා ඇගයීමේ ගුණාත්මක බව වැඩිකල යුතුය. |